# භාවනාවට බාධා පමුණුවන දසවිධ පළිබෝධ ධර්ම පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක්

දර්ශනපති කරපික්කඩ සෝභිත හිමි

## හැඳින්වීම

බුදුසමයේ පරම නිෂ්ඨාව නිර්වාණයයි. එම උත්තරීතර තත්ත්වයට පත්වීමට ඇති චරණමය ප්‍රතිපදාව භාවනාව තුළින් නිර්දේශ කර තිබේ. භාවනා වඩන යෝගාවචරයා භාවනාවට බාධා පමුණුවන කරුණු කවරේ ද යන්න පිළිබඳ අවබෝධයකින් සිටීම සහ ඒවා දුරු කිරීම ස්වකීය අරමුණ සාර්ථක කර ගැනීම සඳහා වැදගත්ය. භාවනා බාධක ධර්ම පෙළ සාහිත්‍යයේ ''පළිබෝධ'' යනුවෙන් හඳුන්වා තිබේ.

''පළිබෝධ'' යනු බාධාව, කරදරය යන අර්ථ දෙන පදයකි. මඩිතියවෙල ශ්‍රී සුමංගල සිංහල විශ්ව කොෂයේ ඊට මාර්ග බාධක, නිවන් අවබෝධ කර ගැනීමේ දී ඇතිවන අවහිරය, පීඩාව යන අර්ථ සපයා තිබේ.[1] එසේම පාලි ඉංග්‍රීසි ශබ්ද කෝෂයේ මෙය විස්තර කර ඇත්තේ අවහිරය, බාධාව, සම්බාධකය, අනතුර, පරිසය යනුවෙනි.[2] පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පාලි සිංහල අකාරාදියේ ''පළිබෝධ'' යන්නට බාධාව, කරදරය යන අර්ථ සපයා ඇත.[3] බුදුරජාණන් වහන්සේ විසින් ද නිවන් මගට බාධා පමුණුවන ධර්ම ''පළිබෝධ'' වශයෙන් හඳුන්වා ඇත. ඛුද්දක නිකායේ චූල නිද්දේසයේ ඛග්ගවිසාණ සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළහ. එනම්

''සො පච්චෙකසම්බුද්ධො සබ්බං ඝරාවාසපළිබොධං ඡින්දිත්වා පුත්තදාරපළිබොධං ඡින්දිත්වා ඤාතිපළිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපළිබොධං ඡින්දිත්වා සන්නිධිපළිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා ආකිඤ්ඤභාවං උපගන්ත්වා එකො චරති''

එම සූත්‍රයේ ''පළිබෝධ'' ධර්ම පහක් අතුළත්ව තිබේ. එනම්

ගෘහවාස පළිබෝධය

අඹුදරු පළිබෝධය

ඤාති පළිබෝධය

හිතමිත්‍ර පළිබෝධය

එහිදී පළිබෝධ යන්නෙන් අර්ථවත් කර ඇත්තේ භෞතික සම්පත්ය. ඒවා උපාදානය කර ගැනීම හේතුවෙන් කෙළෙස් සහිත සත්ත්වයෝ සසර ගමන් කරති. එම සියලු සම්පත් සහිත බාධක පසෙකලා බුද්ධාදී උත්තමයන් නිර්වාණය කරා ගමන් කරන බව ඉහත සූත්‍රය තුළින් තවදුරටත් අවධාරණය කරයි.

''පළිබෝධ'' ධර්මයන්ගේ ඉතිහාසය පිළිබඳ කරුණු විමසා බැලීමේ දී එය ප්‍රාග් බෞද්ධ යුගය දක්වා ඈතට දිවයයි. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සිට පැවති භාවනා ක්‍රමයන් විවිධ අවධීන්වල වරින් වර සංවර්ධනයට පත් වී බුද්ධ කාලය වන විට වඩාත් දියුණු තත්ත්වයක පැවති බවට සාධක ඉතිහාස තොරතුරුවලින් සනාථ වේ. විශේෂයෙන් හින්දු යෝග දර්ශන තුළ වඩා වැඩි අවස්ථාවක් භාවනාව සඳහා ලබා දී තිබුණු බව පෙනේ. හින්දු යෝගීන් විසින් යෝග අභ්‍යාසය සහ වෛරාග්‍ය යන දෙක මුල් කරගෙන සිතෙහි ඇතිවන සිතුවිලි නිරුද්ධ කර සිත සමාධි ගත කර ගැනීමට උත්සාහ දරා ඇත. එසේ සිත සමාධි ගත කිරීමට උත්සාහ දැරීමේ දී යෝග දර්ශනයේ සමාධි බාධක ධර්ම රැසක් පෙන්වා දී තිබේ.



යෝග දර්ශනයට අනුව මිනිසා තුළ පවත්නා සත්ව, රජස්, තමස් යන ගුණත්‍රයෙන් රජස් සහ තමස් යන ගුණ දෙකින් පුද්ගලයා මෙහෙයවයි. එමගින් ඇතිවන බාධක නවයක් උපනිෂද් ග්‍රන්ථවල දක්වා තිබේ. එනම්

01. ව්‍යාධි (සප්ත ධාතූන්ගේ විෂමතාවයෙන් උපදින ජ්වර ආදිය)
02. ස්ත්‍යාන (සිතෙහි ඇතිවන අකර්මන්‍යතාවය)
03. සංශය (සමාධිය ලැබේ ද නොලැබේ ද යනුවෙන් ඇතිවන සැකය)
04. ප්‍රමාද (යෝග වැඩීමේ දී ඇතිවන උදාසීනත්වය)
05. ආලස්‍ය (කයෙහි සහ සිතෙහි ඇතිවන බර බව)
06. අවිරති (රූපාදී විෂය වස්තූන් කෙරෙහි ආශාව)
07. භ්‍රාන්ති (දර්ශන වැරදි ඥානය, ලණුව සර්පයෙක් ලෙස සහ සර්පයා ලණුවක් ලෙස දැකීම)
08. අලබ්ධ භූමිකත්ව (සමාධි භාවනාව සඳහා සුදුසු ස්ථානයක් නොලැබී යාම)
09. අනවස්ථිතත්ව (සමාධි භාවනාව සඳහා සුදුසු ස්ථානයක් තිබුන ද සිත එහි නොපිහිටීම.)[4]

යථෝක්ත කරුණු නවය යෝග භාවනායෝගියාට මුහුණ දීමට සිදුවන අභ්‍යන්තර සහ බාහිර සමාධි බාධක ධර්ම බව හින්දු දර්ශනයේ සඳහන් වේ.

බුදුසමයේ යෝගාවචරයාට තම ඒකායන අරමුණ කරා ගමන් කිරීමේ දී ඇතිවන භාවනා බාධකයෝ ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්

අභ්‍යන්තර පළිබෝධ

බාහිර පළිබෝධ

භාවනා කිරීමේ දී පුද්ගලාභ්‍යන්තරයේ ඇතිවන රාග, ද්වේෂ, මෝහාදි ක්ලේශ ධර්මයෝ අභ්‍යන්තර පළිබෝධ නම් වේ. එම අභ්‍යන්තර පළිබෝධයන් පදනම් කර ගෙන භෞතික හෙවත් බාහිර පළිබෝධ උපදි. බාහිර පළිබෝධ භාවනාව සඳහා සෘජුවම යොගාවචරාට බලපෑම් ඇති කරයි.

සමාධි බාධක ධර්ම දහයක් අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියෝ විශුද්ධිමාර්ගයේ කර්මස්ථාන නිර්දේශයේ සඳහන් කර තිබේ. එවැනි "පළිබෝධ" හෙවත් බාධක එකක් හෝ ඇත්නම් බවුන් වඩන්නාට භාවනා කිරීමෙන් එල නොලැබිය හැකි බව විසුද්ධිමාර්ගයේ සඳහන් කර ඇත්තේ මෙසේය.[5]

"ලෞකික සමාධිය වනාහි යට ශීල පරිච්ඡේදයෙහි දැක්වුණු සේ සිල් පිරිසිදු කොටගෙනැ සුපිරිසිදු සීලයෙහි පිහිටා දස පළිබෝධ අතුරෙන් එක් පළිබෝධයක් හෝ ඇත්නම් එය ද දුරුකොට කමටහන් දෙන කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමක් කරා එළඹ සතලිස් කර්මස්ථාන අතුරෙන් ස්වකීය චරිතානුකූල වූ කර්මස්ථානයක් ලබාගෙන සමාධි භාවනාවට අයෝග්‍ය විහාරස්ථාන හැරපියා, යෝග්‍ය විහාරස්ථානයක වසමින්, සුළු පළිබෝධ ද දුරුකොටැ භාවනාවට නියම විධි එකකුදු නොපිරි හෙලමින් භාවනා කටයුතු"[6] යනාදි වශයෙනි.

විශුද්ධිමාර්ගයේ කර්මස්ථාන නිද්දේසයේ දැක්වෙන දසවිධ පළිබෝධ ධර්මයෝ මෙසේය.

"ආවාසො ච කුලං ලාභො ගණො කම්මඤ්ච පඤ්චමං

අද්ධානං ඤාති ආබාධො ගන්ථො ඉද්ධිති තෙ දස "[7]



ආවාස පළිබෝධ

කුල පළිබෝධ

ලාභ පළිබෝධ

ගණ පළිබෝධ

නවකම්ම පළිබෝධ

අද්ධාන පළිබෝධ

ඤාති පළිබෝධ

ආබාධ පළිබෝධ

ග්‍රන්ථ පළිබෝධ

ඉද්ධි පළිබෝධ යනුවෙනි.

ඉහත පළිබෝධවල ස්වභාවය අනුව පුද්ගල, ස්ථාන, කායික, ක්‍රියා හා ආධ්‍යාත්මික වශයෙන් ද බෙදා දැක්විය හැකිය.

පුද්ගල පළිබෝධ

කුල පළිබෝධ

ගණ පළිබෝධ

ඤාති පළිබෝධ

ස්ථාන පළිබෝධ

ආවාස පළිබෝධ

කර්මාන්ත පළිබෝධ

මාර්ග පළිබෝධ

කායික පළිබෝධ

ආබාධ පළිබෝධ

ක්‍රියා පළිබෝධ

ග්‍රන්ථ පළිබෝධ

ආධ්‍යාත්මික පළිබෝධ

ඍද්ධි පළිබෝධ

## ආවාස පළිබෝධ

"ආවාස" යනු තමන් වෙසෙන වාසස්ථානය යි.[8] මානව වර්ගයාගේ පැවැත්ම සඳහා අවශ්‍ය මූලික සාධක සතරක් අවශ්‍ය වේ. එනම් චීවර (ඇඳුම්), පිණ්ඩපාත (ආහාර) සේනාසන (නිවාස) ගිලානප්‍රත්‍යය යි. (ඖෂධ).[9] මෙම ප්‍රමුඛ අවශ්‍යතාවන් අතර එකකි වාසස්ථාන හෙවත් සේනාසන. බුදුරජාණන් වහන්සේ ආවාස පරිහරණය අනුමත කර ඇත. එසේම සේනාසනය සිහිනුවණින් භාවිත කිරීම සඳහා උපදෙස් රැසක් ද ලබා දී තිබේ. යම් භික්ෂුවක් සේනාසනය භාවිත කරන්නේ ද ඔහු විසින් මෙසේ ප්‍රත්‍යවේක්ෂා කළ යුතුය.

"මා විසින් තොපට යම් සෙනෙස්නෙක් අනුදන්නා ලද ද එය යම්තාක් ම සීත නසනු පිණිස, උෂ්ණය නසනු පිණිස, ඇට මැසි මදුරු අව් සුලං සර්ප යන මොවුන්ගේ ස්පර්ශය වළක්වනු පිණිස, ඍතු විපර්යාසයන්ගෙන් වන උවදුරු දුරලීම පිණිස, චිත්ත විවේකයෙහි ඇලෙනු පිණිස සෑහෙයි" යනුවෙනි. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට සේනාසන පරිහරණය කළ යුතු පිළිවෙල ද චුල්ලවග්ගපාළියේ සේනාසනක්ඛන්ධකයේ දේශනා කොට තිබේ..[10]



යෝගාවචරයාට තම අරමුණු කරා ගමන් කිරීමේ දී වාසය කරන ස්ථානය හෙවත් පරිසරය පිළිබඳ අවබෝධය වඩා වැදගත් වේ. බෝසතාණන් වහන්සේ ද බුද්ධත්වය අවබෝධ කර ගැනීමට සුදුසු පරිසරයක් සොයාගත් ආකාරය ම.නි. අරියපරියෙසන ආදි සූත්‍රවලින් ප්‍රකට වේ. එසේම සං.නි. මෙත්ත සූත්‍රය දේශනා කිරීම සඳහා හේතුවූ නිදානය විමසා බැලීමෙන් තත් කරුණ තවදුරටත් සනාථ කරගත හැකිය. භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ලබාගෙන බවුන් වැඩීමට හිමාලය ආසන්නයේ එක්තරා වන ලැහැබකට වැඩියහ. එහි වැඩි භික්ෂූන් වහන්සේ වනයේ වෘක්ෂ මූලයන්වල හිඳිමින් බවුන් වැඩීමට පටන් ගත්හ. මේ නිසා වෘක්ෂයන්ට අධිපති දෙවිවරු මහත් කරදරයකට පත්වූහ. ඔවුහු සියලු දෙනා එක් වී භික්ෂූන් වහන්සේලා බියට පත් කළහ. නැවත බුදුරදුන් වෙත පැමිණ මේ කරුණ සැළකිරීමෙන් අනතුරුව උන්වහන්සේ විසින් මෙත්ත සූත්‍රය ප්‍රගුණ කරවා ආපසු එම වනයට ම භික්ෂූන් යැවූහ. භික්ෂූන් මෙත්ත සූත්‍රය සජ්ඣායනය කිරීමෙන් දෙවියෝ සතුටට පත්ව ඔවුන්ට උපස්ථාන කළහ. භික්ෂූන් ද භාවනා කොට නිවන් අවබෝධ කර ගත්හ. එබැවින් තමන් වාසය කරන පරිසරය පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධයනට බලපාන බව පෙනේ.

"ආවාසය" කෙසේ නම් පළිබෝධයක් වේද? යම් භික්ෂුවක් තමන් වාසය කරන ආවාසය උපාදාන සහිතව අල්වාගනී ද? එය පළිබෝධයක් හෙවත් නිවනට බාධාවකි. විහාරස්ථානය. පන්සල, සංඝාරාමය, පිරිවෙන හෝ වෙනත් වාසයට සුදුසු ස්ථානයක වාසය කරමින් එම විහාරස්ථායේ නව කර්මාන්තාදිය ආරම්භ කරයි ද? වතු පිටි ආදිය කෙරෙහි මෙන්ම ඒවායේ වැඩකටයුතු කරන පුද්ගලයන්ගේ කටයුතු සොයා බලයි ද? එම ආවාසයේ බඩු බාහිරාදිය පිළිබඳ මෙන්ම සිදු කරනු ලබන කුදු මහත් කටයුතු සොයා බැලීමට සිදුවෙයි ද? ඔහුට ආවාසයේ කාර්යයන් ඉටු කිරීම විනා භාවනා කිරීමට කාල පරිච්ඡේදයක් උදා නොවේ. එවැනි භික්ෂුවට ආවාසය පළිබෝධයකි. දිනපතා විවිධ බාහිර කාර්යන්වල

නියැලීමට සිදු වන නිසා ආවාසය, පන්සල, පිරිවෙන, ආශ්‍රම, අසපු, නිකේතන සහ සංඝාරාමාදිය සමාධි භාවනාව වැඩීමට යෝග්‍ය නොවේ. තවද විහාරස්ථාන තුළ වාසය කරන විට භික්ෂුව දායකයා වෙනුවෙන් කටයුතු සිදු කළ යුතු වේ. දායකයාගේ කුදු මහත් කටයුතු වන දාන, පිරිත්, ධර්ම දේශනා, අවමඟුල්, උත්සව, බෝධි පූජා යනාදිය සිදු කර දිය යුතුය. පරිවේණස්ථානයේ ධර්ම ශාස්ත්‍ර හදාරන ගිහි පැවිදි පිරිසට ඉගැන්වීම සහ මග පෙන්වීම සඳහා කාලය වැය කළ යුතු වේ. එකල්හි භාවනා පුහුණු කිරීමට හෝ සිත සමාධිගත කර ගැනීමට භික්ෂූන් වහන්සේට අවස්ථාව නොලැබේ. එනිසා ආවාසයේ ඇලීම ආවාස පළිබෝධ නම් වේ.

එහෙත් යමෙක් තුළ ආවාසය කෙරෙහි ඇලීමක් නොමැති ද ඔහුට ආවසාය පළිබෝධයක් නොවන අයුරු බුද්ධඝෝෂ හිමියෝ විශුද්ධිමාර්ගයේ දෘෂ්ටාන්ත කථාවක් මගින් මෙසේ පැහැදිළි කරති.

අනුරාධපුරයේ ථූපාරාමයේ දරුවන් දෙදෙනෙක් පැවිදි වූහ. ඔවුන් අතුරෙන් එක් භික්ෂුවක් උභය ප්‍රාතිමෝක්ෂය ප්‍රගුණ කොට පස් වස් විසීමෙන් පවාරණය කොට පාචීනඛණ්ඩරාජි නම් තැනට වාසය කිරීම පිණිස ගියේය. අනිත් භික්ෂුව ථූපාරාමයෙහි ම විසීය. පාචීනඛණ්ඩරාජියට ගිය භික්ෂූව එහි ටික කලක් වාසය කොට "මේ ස්ථානය විවේකයට සුදුසුය. මගේ යහළු භික්ෂූන් වහන්සේට මේ බව දන්වමි'' යැයි සිතා නැවත ථූපාරාමයට වැඩියේය. එන්නා වූ එම භික්ෂුව දැක සමාන වස්සික තෙරුන් වහන්සේ පෙර ගමන් ගොස් පා සිවුරු පිළිගනිමින් වත් පිළිවෙත් කළ සේක. ආගන්තුක තෙරුන් වහන්සේ සේනාසනයට පිවිස ''මේ මෙහි බොහෝ කලක් වසන්නේය. මාගේ මිත්‍රයා මට දන් ගිතෙල් හෝ පැණි හෝ වෙන පාන වර්ගයක් හෝ එවනවා ඇතැයි'' සිතුවේය. රාත්‍රිය ඉක්මිණි. කිසිවක් නොලැබුනේය. උදෑසන සිතන්නේ ''දූන් උපස්ථායකයක් එවතියි'' සිතුවේය. එවිට ද කිසිවෙකු හෝ නො එවූහ. ''මෙහි නො එවුව ද ගමට ගිය කළ ලබන්නෙම් වේදැ''යි උදෑසන ම නේවාසික



භික්ෂුව සමග පිණ්ඩපාතය සඳහා ගමට පිවිසියේය. මුළු වීථියෙහි ම ඇවිද කැඳ ටිකක් ලබන ලද අතර එය ආසන ශාලාවෙහි ම හිඳ වැළඳුවාහුය. උදෑසන පෙරූ කැඳ නැතත් දහවල ප්‍රණීත දෑ දෙතියි සිතුවේය. දහවල පිණ්ඩපාතය ද ලද දෙයක් ම වළඳා ''කිම ස්වාමිනි හැමදාම මෙසේ යැපෙන්නේ දැයි'' ඇසුවේය. උන්වහන්සේ ''එසේය'' යයි කීවේය. ''ස්වාමිනි අප වසන පාචීනඛණ්ඩරාජිය මෙයට වඩා පහසුය. එහි වඩිනු මැනවැයි'' ආගන්නතුක භික්ෂුව කීවේය. තෙරුන් වහන්සේ නුවර දොරින් නික්ම ථූපාරාමයට යන මග හැර කුඹල් ගමට වඩින මාර්ගයට පිවිසියේය. ''ස්වාමිනි කුමක් හෙයින් මේ මගට පිවිසියේ දැයි'' විචාළ කල්හි ''ඇයි ආයුෂ්මතුනි පාචීනඛණ්ඩරාජිය වර්ණනා කළේ නොවේද? එහි යමුයි'' කීවේ ය. ස්වාමිනි මෙතෙක් කල් විසූ තැන කිම වැඩි පිරිකරෙක් නැද්දැයි ඇසූ කල ''ආයුෂ්මතුනි ඇඳ පුටු ආදිය සාංඝිකය එය එහි ම තැන්පත් කළෙමු. අන් කිසිවක් එහි නැතැයි'' කිවේය. ස්වාමිනි මාගේ සැරයටිය ද තෙල්ගුලාව ද, වහන් උරය ද එහි ය. ''ස්වාමිනි එක් දවසක් විසූ තැන තොප එතෙක් බඩු එහි තබන ලද්දේදැයි'' විමසීය. ''එසේය'' යැයි කීවේය. ආගන්තුක භික්ෂුව පැහැදී තෙරුන් වහන්සේට වැඳ ''ස්වාමිනි නුඹ වහන්සේ වැන්නවූන්ට සැම තැන ම ආරණ්‍යමය. ථූපාරාමය සතර බුදුවරුන්ගේ ධාතු නිදාන ස්ථානයයි. ලෝවාමහාපායෙහි පහසුවෙන් ධර්මය ශ්‍රවණය කළ හැකිය. ස්වාමිනි නුඹ වහන්සේ මෙහි ම වාසය කළ මැනව. අපි යම්හයි'' දෙවන දවසෙහි පා සිවුරු ගෙන තෙමේම පාචීනඛණ්ඩරාජියට ගියේය.[11] එවැනි භික්ෂූන්ට කෙබඳු ආවසයක් වුව ද පළිබෝධ පිණිස නොවේ. යථෝක්ත දෘෂ්ඨාන්ත කථාවෙන් පැහැදිළි වන්නේ යමෙක් ආවාස කෙරෙහි ඇල්මක් නැද්ද ඔහුට ආවාසය පළිබෝධය නොවන බවයි. එසේම තමන් වාසය කරන ස්ථානය කෙරෙහි ආශාවක් පවතී ද එවැන්නන්ට පවතින්නේ ආවාස පළිබෝධය යි.

## කුල පළිබෝධ

"කුලය" වනාහි දෙවදෑරුම්ය. ඤාති කුලය, උපස්ථායක කුලය වශයෙනි.[12] ඤාති කුලය නම් ස්වකීය ඤාති සමූහයා ය. එනම් මව්පිය, දූදරු, සහෝදර, සහෝදරියන්, නෑදෑ හිතමිත්‍රාදීන්ය. උපස්ථායක කුලයට සිව් පසයෙන් උපස්ථාන කරන දයක දායිකා පිරිස අයත් වේ. සං.නි. ඛග්ගවිසාණ සූත්‍රයේ දක්වන පළිබෝධ අතර ද මෙම පළිබෝධය ඇතුළත් වී ඇත. නිවනට ගමන් කරන තැනැත්තා විසින් අනිවාර්යයෙන්ම දුරු කළ යුතු බලවත් පළිබෝධයක් ලෙස ඤාති පළිබෝධය පෙන්වා දිය හැකිය. සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ විසින් සිදුකළ මහාභිනිෂ්ක්‍රමණය සිදු කරන අවස්ථාවේ නොකැමති වූ කඳුළු පිරුණු මුහුණ ඇති දෙමාපියන් හඬද්දීම කෙස් රැවුළු බා කසාවත් හැද පැවිදි වූ බව ම.නි. අරියපරියෙසන සූත්‍රයේ සඳහන් වේ.[13] ඒ තුළින් ද පැහැදිළි වන්නේ කුල පළිබෝධය දුරු කළ ආකාරයයි. බුදුරජාණන් වහන්සේ කුලය පළිබෝධයක් ලෙස සලකා ක්‍රියා කල යුතු බව දේශනා කර තිබේ.

කුලය පළිබෝධයක් වන්නේ කෙසේ ද? යම් විහාරස්ථානයට නිරන්තරයෙන් ඥාතීන් හෝ දායක දායිකාවන් පැමිණෙන කල්හි භික්ෂුවට භාවනා කිරීමට පසුබිමක් උදා නොවේ. දායකයන් ද නිතර විහාරස්ථානයට පැමිණ ධර්ම කථාවන් සහ වෙනත් කථාවන්වල නිරත වීම නිසා භාවනා කළ නොහැකි වේ. එසේම භික්ෂුව ද දායක හා උපස්ථායක පිරිස් සමග ඇති සම්බන්ධතා නිසා ඔවුන්ගේ ගෘහයන්ට නිතර යාමට සිදු වේ. සැප හෝ දුක්ඛදායක අවස්ථාවන් වලදී එසේ ක්‍රියා කිරීමට භික්ෂුවට සිදුවන නිසා භාවනා කිරීමට කාලයක් උදා නොවේ. ඤාතීන්ගේ සහ දායක දායිකාවන්ගේ කටයුතු පමණක් සොයා බැලීමට සිදු වේ. එබැවින් කුලය ද භාවනා පළිබෝධයකි.

එහෙත් ඥාතීන් පළිබෝධයක් වශයෙන් නොසලකා ක්‍රියා කළ භික්ෂුවක් පිළිබඳ විස්තරයක් විසුද්ධිමාර්ගයේ සඳහන් වේ.



කොරණක නම් මහාවිහාරවාසී මහතෙර කෙනකුන්ගේ බෑනණු වූ දහර භික්ෂූන් වහන්සේ නමක් ත්‍රිපිටකය පුහුණු වීම සඳහා රුහුණු ජනපදයට වැඩියහ. තෙරුන් වහන්සේගේ සහෝදරිය හැම විටම තෙරුන් වහන්සේගෙන් තම පුතා පිළිබඳ තොරතුරු විචාරන්නීය. එක් දවසක තෙරුන් වහන්සේ දහර භික්ෂුව කැඳවාගෙන එනු පිණිස රුහුණුට ගියහ. දහර භික්ෂුව ද මම මෙහි බොහෝ කාලයක් වාසය කළෙමි. "උපාධ්‍යයන් වහන්සේ ද දූක මැණියන්ගේ ද තොරතුරු දැනගෙන එමි"යැයි රුහුණින් නික්මුණේය. දෙදෙනා වහන්සේ ම මහවැලි ගං ඉවුරේ දී මුන ගැසුණාහ. දහර භික්ෂුව වෘක්ෂ මූලයක් ළඟ දී තෙරුන් වහන්සේට වතාවත් දක්වා "කොහි යන්නේ දැයි" විචාල කල්හි තමන්ගේ ගමන කීවේය. තෙරුන්වහන්සේ ද එපවත් අසා සතුටට පත්ව "ඔබ කළේ යහපතකි. උපාසිකා තොමෝ නුඹ ගැන සුවදුක් විමසති. අපි එන්නමෝ ත් තොප එහි යවනු සඳහා ආවෙමු. තොප එහි යව්. අප මෙහි වස් වසන්නෙමු" යයි ශිෂ්‍ය නම යැවූ සේක. දහර භික්ෂුව වස් වසන දිනයෙහි ම කොරණක විහාරයට සම්ප්‍රාප්ත විය. ස්වකීය පියාණන් වහන්සේ විසින් කරන ලද විහාරයෙහි ම වස් විසීය. දෙවන දවසෙහි පියාණන් විහාරයට අවුත් "අපගේ සෙනසුන කා හට ලැබුනේදැයි" භික්ෂූන්ගෙන් විචාරා "ආගන්තුක භික්ෂුවට යැයි" කී කල්හි උන්වහන්සේ වෙත එළඹ වැඳ "ස්වාමීනි අපගේ සෙනස්නෙහි වස් විසූ තැනැත්තා විසින් පිළිපැදිය යුතු වතෙක් ඇතැයි" කීහ. කවර වතෙක්දැයි විචාරන්නේ "මේ තෙමස අපගේ ගෘහයෙන් ම භික්ෂාව ගත යුතුය. පවරා වඩින දවස්හි අපට දන්වා වැඩිය යුතු"යි කීහ. උන්වහන්සේ තුෂ්ණීම් භූත භාවයෙන් ඉවසූ සේක.

උපාසකයා ද ගෙට ගොස් "අපගේ ආවාසයෙහි එක් ආගන්තුක නමක් වස් විසී ය. උන්වහන්සේට සකසා උපස්ථාන කළ යුතු"යි කීහ. උපාසිකාව ද "මැනවැයි" පිළිගෙන සිව්පසයෙන් වස් තුන් මාසය ම උපස්ථාන කොට වස් අවසන් හි පවරා "මම යමියි" කීහ. ඔවුහු ද අද ඉවසා හෙට වඩින්න යැයි ආරාධනා

කොට දෙවන දවසෙහි සිය නිවසේ දීම දානය වළඳවා තෙල් නල ද පුරවා සකුරු පිඩක් සහ නවරියන් වස්ත්‍රයක් පූජා කොට ''වඩින්න ස්වාමිනියි කිවුය. උන්වහන්සේ අනුමෙවෙනි බණ වදාරා රුහුණ බලා වැඩි සේක.

උපාධ්‍යායයන් වහන්සේ ද වස්වසා පවාරණය කොට පෙරළා වඩින සේක් පෙරදුටු මහවැලි ගං ඉවුරේදීම දහර නම දුටුවේය. හේ රුක්මුල දී තෙරුන් වහන්සේට වත් දක්වා '' භද්‍රමුඛය මැණියන් දුටුවේදැයි'' විමසීය. ''එසේය ස්වාමිනි දුටුම්හයි'' සියලු පුවත් දන්වා ඒ තෙලින් උන්වහන්සේගේ පා මැඩ සකුරින් පානයක් සාදා වළඳවා ඒ සළුවත් පුදා වැඳ ''ස්වාමිනි මට රුහුණ සැපය''යි කියා ගියේය.

තෙරුන් වහන්සේ ද විහාරයට ගොස් දෙවන දින කොරණක ගමට වැඩි සේක. උපාසිකා තොමෝ මාගේ පුතණුවන් ගෙන දූන් එතීයි සැමදා මග බලමින් ඉන්නීය. එදා ද තනිව වඩින තෙරුන් වහන්සේ දැක ''මාගේ පුතණුවන් වහන්සේ මියගිය සේකැයි මා සිතමි. තෙරුන් වහන්සේ තනිව වඩිතීයි'' උන්වහන්සේගේ දෙපා මුල වැටී පෙරලී වැළපෙමින් හැඬුවාය. තෙරුන් වහන්සේ සිතන සේක් ''ඒකාන්තයෙන් දහර නම අල්පෙච්ඡතාව හේතුවෙන් තමන් නොහඳුන්වා ම ගියේ වනැයි'' ඇය සනසා සියලු පුවත් දන්වා පාත්‍රථවිකයෙන් ඒ සළුව ද මැත්කොට පෙන්වූහ. උපාසිකාවෝ පැහැද පුතුගිය දිසාවට ළයෙන් හෙව වැටීගෙන කියන්නී බුදුරජාණන් වහන්සේ රථවිනීත - කාගක- තුවටක ප්‍රතිපදා ද, සිව්පසය ද සංතෝෂය ද භාවනාරමතා දක්වන මහා ආර්යවංශ ප්‍රතිපදා ද වදාරන සේක් මාගේ පුතණුවන් වහන්සේ වැනි භික්ෂූන් ම කාය සාක්ෂි කොට වදාළ සේක් විය යුතුය. වැදූ මැණියන්ගේ ගෙයි තුන් මසක් වළඳමිනුත් මා තොපගේ පුතණුවෝ ය. නුඹ මාගේ මැණියෝය'' යයි නොකී සේක. ''අහෝ ආශ්චර්ය මනුෂ්‍යයා''යි කීහ. මෙබන්දන්ට මව්පිය ඥාතීන් පළිබෝධ නොවේ. සෙසු උපස්ථායක කුල ගැන කියනු කවරේද?[14] එවැනි භික්ෂූන් වහන්සේලාට කුලය පළිබෝධයක් නොවේ.



## ලාභ පළිබෝධ

''ලාභ'' නම් සිව්පසය යි.[15] භික්ෂූන් වහන්සේලාගේ පැවැත්ම සඳහා දායක දායිකාවන් විසින් සිව්පසය සහ වෙනත් පුද පූජා සිදු කරයි. එසේ ලැබෙන ලාභ කෙරෙහි යමෙක් ගිජුව වාසය කරයි ද නැවත එයම ප්‍රාර්ථනා කරයි ද එය මහිච්ඡතාවයි. එසේ මහිච්ඡතාවයෙන් දුරුව අල්පෙච්ඡ ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම සෑම අවස්ථාවක ම බුදුරජාණන් වහන්සේ විසින් අවධාරණය කර තිබේ. භික්ෂුව විසින් පිණ්ඩපාතය පවා ගත යුත්තේ පුරුෂ මදය සඳහා නොවේ. (න මදාය) ශරීරය සැරසීම සඳහා නොවේ. (න මණ්ඩනාය) ශරීරයේ අලංකරණය පිණිස නොවන බව (න විභූසනාය) අල්පේච්ඡ ජීවිත පැවැත්මක් සඳහා (ඉමස්ස කායස්ස ඨිතියා) පමණක් බව සිතිය යුතු බව ම.නි. සබ්බාසව සූත්‍රයේ සඳහන් වේ.[16] සසර බිය දැක සියලු සම්පත් හැරදා පැවිදි වූ පුද්ගලයාට භික්ෂුව යැයි කියමු. ඔහුගේ එකම අරමුණ විය යුත්තේ සසර තරණය කිරීමය. ඒ සඳහා භික්ෂුව අල්පේච්ඡ ජීවිතයක් ගත කළ යුතුය. කාය පරිහරණය සඳහා චීවරය ද කුසට අහරක් ද තිබීම ඒ සඳහා ප්‍රමාණවත් වේ. පක්ෂියෙකු කැමති තැනට ගමන් කරන්නේ පියාපත් බර පමණක් ම වේ ද භික්ෂුව ද එසේම පාත්‍රය හා සිවුරු බර පමණක් ම ඇති අයෙක් විය යුතුය.[17] එසේම භික්ෂුව හුදු ලාභ අපේක්ෂාවෙන් ක්‍රියා නොකළ යුතු බව පිණ්ඩොල භාරද්වාජ හිමිගේ කථා පුවතින් ද සනාථ වේ. එනිසා ලාභ හෙවත් ලැබීම් කෙරෙහි භික්ෂුව ලොල් නොවිය යුතු වේ.

සිව් පසය කෙසේ නම් පළිබෝධ වෙත් ද? සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලා ඇති විහාරස්ථානවලට දායක දායිකාවන් නිරන්තරයෙන් පැමිණේ. එනිසා බොහෝ පුද පූජාදිය ද ලැබේ. ලාභ යනුවෙන් අදහස් කරන්නේ මෙසේ ලැබෙන සිවුරු පිරකර දානෝපකරණ සහ වෙනත් උපකරණාදියයි. මෙසේ ලාභ ලැබීම යෝගාවචරයාට මහත් බාධාවකි. ඇතැම් භික්ෂූන් වහන්සේලා

දායකයන්ට ධර්මය දේශනා කරමින් ශ්‍රමණ ධර්ම පුරාගන්නට අවකාශ නොලබයි. උදෑසන සිට රාත්‍රිය දක්වා ම මිනිසුන් හා එක්ව කාලය ගත කරයි. එහි ම ව්‍යාවෘත වෙත්. මෙසේ ඇති කල්හි ඔවුනට ඒ ප්‍රත්‍යයෝ පළිබෝධ වන්නාහ. එහෙත් පුද පිරිකර ගොඩ ගසාගෙන සිටීමෙන් බහු භාණ්ඩික භික්ෂුවක් බවට පත්වේ. එම දානෝපකරණ පිළිබඳ සිතමින් කල් ගත කිරීමට සිදුවේ. එම ලාභ කෙරෙහි තෘෂ්ණාව උපදවා ගනී. තෘෂ්ණාව නිසා තව තවත් ලාභයන්ම සොයති. ගිහියාට ද නෑදෑ හිතමිතුරන්ගෙන් නොයෙක් ත්‍යාගාදිය ලැබේ. ඒවා පිළිබඳ සිතමින් කල් ගත කිරීම නිසා භාවනාව සඳහා අවකාශ නොලැබේ. එනිසා ලාභ හෙවත් පුද පූජාදිය ද භාවනා බාධකයක් වේ.

### ගණ පළිබෝධ

''ගණ'' යනු සමූහයා හෙවත් පිරිස යන තේරුම ඇත්තකි. භික්ෂූන් විෂයෙහි භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා යන සිව්වණක් ''ගණ'' යනුවෙන් අදහස් කෙරේ. විශුද්ධිමාර්ගයේ සූත්‍රාන්ත හෝ අභිධර්මය හදාරන පිරිස ගණ මෙනමින් හඳුන්වා තිබේ.[18] පැවිද්දකු නම් තමා සමීපයේ ධර්ම විනය හදාරන ශිෂ්‍යයින් සහ අන්තේවාසිකයන් ඊට අයත්ය. ගණ හෙවත් පිරිස සමග ජීවත් වීමට වඩා හුදකලාව වාසය කිරීම බුදුසමය අනුමත කර ඇති ආකාරය සූත්‍රාගත කරුණු විමසා බැලීමෙන් පෙනී යයි. බෝධිසත්වයෝ ද බුදුබව ලැබීම ඉක්මන් වූයේ පස්වග තවුසන්ගෙන් වෙන් වූ නිසාය. තවද පිරිසගෙන් වෙන්ව එකාකි හෙවත් හුදකලාව ජීවත් වීම බුදුරජාණන් වහන්සේ ද අගය කර තිබේ. වරෙක ''මනා පැවතුම් සහිත දිරිමත් නුවණැති පිරිසක් නොමැති නම් රජු හා විජිතය හැර වනයට පිවිසෙන ඇතකු මෙන් හුදකලාව වාසය කිරීම සුදුසු බව පෙන්වා දී තිබේ.[19] තවත් වරෙක තනිව හැසිරෙමින් සසර තරණය කිරීමට උත්සාහ ගන්නා භික්ෂුව හුදකලාව ජීවත්වන කඟවේනෙකුට සමාන කොට බුදුරජාණන් වහන්සේ දෙසූ සේක.



බවුන් වැඩීම සඳහා තෝරාගත යුත්තේ මිනිස් වාසයෙන් තොර වූ ආරණ්‍ය, වෘක්ෂ මූල සහ ශූන්‍යාගාරයන්ය. එවැනි ස්ථානයන් තෝරා ගැනීම නිසා චිත්ත ඒකාග්‍රතාව පහසුවෙන් ඇතිවේ. එම නිසා ගණයා හා වාසය කිරීම නුසුදුසු වේ. එසේ වාසය කරන්නේ නම් ඔහුට භාවනා ආදී ආධ්‍යාත්මික කටයුතුවලට බාධා පැමිණේ. ධර්ම සහ විනයේ දක්ෂතා ඇති උතුමන් සොයා ගිහි පැවිදි බොහෝ පිරිස් පැමිණෙති. පෙරවරු පස්වරු කාලයේ මෙන් ම රාත්‍රි කාලයෙහි වෙහෙස නොබලා ඔවුන්ට ධර්ම විනය ප්‍රගුණ කිරීමටත් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමටත් සිදු වුවහොත් සිත සමාධි ගත කර ගැනීමට අවස්ථාවක් නොලැබේ.

වර්තමානයේ මෙම පළිබෝධය ඉතා බහුලව දැකිය හැකිය. ධර්මය පිළිබඳ ඉතා ස්වල්ප දැනුමක් සහිත පුද්ගලයන් විවිධ පුද්ගල කණ්ඩායම් නිර්මාණය කොට භාවනා පන්ති පවත්වමින් බුදුසමයේ ඉගැන්වෙන දහම් කරුණු තම තමන්ගේ වැටහීමේ ප්‍රමාණයට දේශනා කරමින් ඔවුන්ගේ හුදු ලෞකික පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා ක්‍රියා කරමින් සිටිති. තවත් පිරිස් තමන්ගේ ඉගැන්වීම් නිවැරදි බවත් සෙසු පිරිස් ධර්මයෙන් මිනිසා මුලාකරමින් කටයුතු කරන බවත් පවසති. කවර අදහසක් දැරුව ද ඔවුන්ගේ මතය පිළිගැනීමට පිරිසක් සිටී. වර්තමානයේ ඇතැම් භික්ෂූන් වහන්සේලාට පිරිස් නිසා විවිධ ක්ලේශයන් මතුවී තම ආධ්‍යාත්මික ගමන පසෙක දමා ලෞකික පරමාර්ථ සපුරා ගැනීමට ගණ ප්‍රධානව, ගණාචරියව කටයුතු කරමින් සිටී. ඒ නිසා ම ගණයා හෙවත් පිරිස සමග වාසය කිරීම භාවනා බාධකයක් වේ.

### නව කම්ම පළිබෝධ

''නව කම්ම'' නම් විහාරස්ථානයේ නව ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ ආදියයි.[20] මෙය නිද්දේස පාළියේ දැක්වෙන පළිබෝධ අතර දැකිය නොහැකිය. එසේ වුවත් විනය පිටකයේ පාරාජිකා පාළියේ විහාරකාර සහ කුටිකාර සංඝාදිසේසවල දී

විහාරයක් හෝ කුටියක් සාදා ගැනීමේ දී බුදුරජාණන් වහන්සේ අනුදත් ප්‍රමාණ ඉක්මවා යයි නම් එය සංඝාදිසේස ආපත්තියක් බව දක්වා ඇත. එනම්

''තමා ඉල්ලාගත් උපකරණයෙන්, කරවා දෙන හිමියෙකු නැති, තමා උදෙසා වූ කුටියක් කරවන මහණහු විසින් පමණක් යුතු කිළියක් කරවිය යුතු. එහි ප්‍රමාණ මෙසේයි. දිගින් සුගත් වියතින් දොළොස් වියතකි. පළල සත් වියතකි. කුටි බිම දෙසනු පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඉඳින් මහණ තෙම උවදුරු සහිත වූ උපචාර රහිත වූ වාස්තුයෙහි ඉල්ලා ගත් උපකරණයෙන් කිළියක් කරවන්නේ නම් භික්ෂූන් නොකැඳවන්නේ නම් හෝ පමණ හෝ ඉක්මවයි ද සංඝාදිසේසයක් වේ.''[21]

එසේම ඡන්න තෙරුන් විසින් විශාල විහාරයක් කරවීමට යාමේදී ඇති වූ ජනතා විරෝධය හේතුවෙන් විහාරකාර සංඝදිසේසය පනවන ලදි. එහි ද ඇතුළත් වන්නේ විහාරයක් ඉදිකරන්නේ නම් එය බුදුරදුන්ගේ නියමය ඉක්මවා ඉදිකළ නොහැකි බවත් එසේ කරන්නේ නම් එය සංඝාදිසේසයක් වේ.

එහෙත් වර්තමානයේ මෙම තත්ත්වයෙන් භික්ෂුව සපුරා බැහැර වී තිබේ. භික්ෂුවගේ මූළික පරමාර්ථය වූ සසර දුක් නැති කිරීම පසෙක ලා තම අභිමතය පරිදි විවිධ වූ විහාර කර්මාන්තවල නිරත වී සිටිති. එබැවින් විහාරස්ථානයේ ඉදිකරන ගොඩනැගිලි නව කම්ම ගණයට වැටේ. වෙහෙර, විහාර, චෛත්‍ය, බෝධිඝර, ධර්මශාලා, පුස්තකාල යනාදිය තනවන්නට වුවහොත් එවායේ අළුත්වැඩියා කරන්නට සිදුවුවහොත් ඊට අවශ්‍ය වඩුවන්, කාර්මිකයන් හා උපකරණ, ද්‍රව්‍ය සැපයීමට සිදු වේ. තවද මේවා සාදවන්නට භික්ෂුව යොමු වන කල්හි එවායේ සේවය කරන්නන්ගේ කුදු මහත් කටයුතු සිදු කිරීමට සිදු වේ. මිල මුදල් කලට වේලාවට දීම, වෙලාවට වැඩ කටයුතු ආරම්භ කිරීම සහ වෙලාවට වැඩ අවසන් කිරීම සිදු වන්නේදැයි අධීක්ෂණය කළ යුතුය. එම වැඩකටයුතු සිදු නොවන්නේ නම් ඒ පිළිබඳ විවිධ



උපදෙස් දිය යුතුවේ. මේවා කිරීමට යාමෙන් සිත එක්තැන් කරගෙන භාවනා වැඩීමට අවස්ථාව නොලැබෙන නිසා මෙය භාවනා පළිබෝධයක් වේ.

## අද්ධාන පළිබෝධ

යා යුතු ගමන් බිමන් ''අද්ධාන'' යනුවෙන් හැඳින්වේ.[22] බුදුරජාණන් වහන්සේ ප්‍රථම රහත් හැටනම අමතා දේශනා කළේ මහණෙනි, බොහෝ දෙව් මිනිසුන්ගේ යහපත සඳහා චාරිකාවේ හැසිරෙන්න. යනුවෙනි. මෙහිදී චාරිකාවේ හැසිරීම භික්ෂුවගේ කාර්යයක් ලෙස දක්වා තිබේ. එසේ නම් චාරිකාවේ හැසිරීම කෙසේ නම් පළිබෝධයක් වේද? ලෞකික පරමාර්ථ සාධනය කර ගැනීමට හෝ දුර ජීවත්වන ස්වකීය ඤාති හිතමිතුරන් දැකීම පිණිස ගමන් බිමන් යා නම් ඔහුට අද්ධාන පළිබෝධය ඇති වේ. යෝගාවචරයාට නිරන්තරයෙන් ගමන් බිමන් යාමට සිදු වුවහොත් භාවනා කටයුතු අතපසු වෙයි. තමාගේ හෝ සෙසු අයගේ කාර්යයන් සඳහා සෙසු විහාරස්ථාන කරා වැඩමවමින් කටයුතු කිරීම භික්ෂුවට උචිත නොවේ. දායක පවුල් සහ ඥාතීන් ළඟින් ඇසුරු කරන විට ඔවුන්ගේ කුදු මහත් කටයුතු සඳහා නොයෙක් තැන්වල යාමට සිදු වේ. එසේ නිතර ගමන් බිමන් ඇති කල්හි භාවනා කටයුතු සඳහා ලැබෙන කාලය ඉතා අල්ප වේ. ඒ නිසා ම ගමන් බිමන් යාම පළිබෝධයකි.

## ඤාති පළිබෝධය

''ඤාතීන්' යනුවෙන් අදහස් කරන්නේ ආචාර්ය, උපාධ්‍යාය, සද්ධිවිහාරික, අන්තේවාසික, සමානෝපාධ්‍යායක, සමානාචාර්යකයෝය, ගෘහයෙහි මවුපිය, ගුරුවරු, ශිෂ්‍ය සහ සහෝදර සහෝදරියන්ය.[23] චුල්ලනිද්දේසයේ බුදුරජාණන් වහන්සේ දක්වන පළිබෝධ ධර්ම අතර ඤාති පළිබෝධය ඇතුළත්ව තිබේ. සම්බාධ සහිත වූ ගිහි ගෙදරින් නික්මුණු කුල පුත්‍රයා දෙමාපියන්, අඹුදරුවන්, ඤාති හිත මිතුරන් සියල්ලෝ ම අත්හැර දමා සසුනේ

පැවිදි වී නිවන ලබා ගැනීම පිණිස ක්‍රියා කරයි. එසේ කටයුතු කරන්නාට ඥාතීන් බාධාවකි. පළිබෝධයකි. ආචාර්ය, උපධ්‍යාය, අන්තේවාසික, සද්ධිවිහාරික යන මොවුන්ගෙන් කවරකු හෝ විහාරස්ථානයේ සිටී නම් ඔවුන්ගේ කටයුතු සොයා බැලීමට සිදුවේ. යම් කටයුත්තක් හෝ සුළු ප්‍රමාදයක් ඇති වුවහොත් ඔවුන් නිසා චිත්ත පීඩාවන්ට පත්වේ. ඔවුන්ගේ කටයුතුවලට කාලය කැප කිරීමට සිදු වන නිසා භාවනා කිරීමට අපහසුය. ඒ පළිබෝධය සංසිඳුවාගත යුත්තේ ඔවුන්ට උපස්ථාන කොටැ ඔවුන් නිරෝගී කිරීමෙන් පළිබෝධ සංසිඳුවාගත යුතුය. එබැවින් ඥාතීන් සමග විසීම ද පළිබෝධයකි.

## ආබාධ පළිබෝධය

ලෝකයේ උපදින සියලු සත්ත්වයන්ට රෝගාබාධ වැළදේ. එය පොදු ධර්මතාවකි. බුදුන්වහන්සේ වදාළේ සත්වයාගේ ශරීරය රෝග නැමති පක්ෂීන්ට කැදැල්ලක් මෙන් පවතින බවයි.[24] සත්වයාට වැළඳෙන රෝගාබාධ කොටස් දෙකකි. එනම්

කායික ආබාධ

මානසික ආබාධ යනුවෙනි.[25]

කායික රෝග හැඳින්වීම සඳහා යොදාගත්තේ ව්‍යාධි හා රෝග යන වචනද්වයයි. කායික රෝග ඇතිවීම සඳහා බලපාන මූලික කරුණු අටක් ගිරිමානන්ද හා අංගුත්තර නිකායේ මෝළිය සීවක යන සූත්‍රවල දක්වා ඇත.

පිතින් උපදනා ආබාධ

සෙමෙන් උපදනා ආබාධ

වාතයෙන් උපදනා ආබාධ

සෘතු විපර්යාසයෙන් උපදනා ආබාධ



විෂම පැවැත්මෙන් උපදනා ආබාධ

උපක්‍රමයෙන් උපදනා ආබාධ

කර්ම විපාකයෙන් උපදනා ආබාධ[26] වශයෙනි.

යථෝක්ත හේතූන් නිසා උපදින රෝග දුක්ඛ වේදනාවන් ඇති කරන බැවින් භාවනා කළ නොහැකි වේ. පුද්ගලයාට කාර්යයන් සඵල කර ගැනීමට නම් නිරෝගී තත්ත්වයක් තිබිය යුතුය. එසේ නිරෝගී භාවයෙන් තොර වූයේ නම් කිසිදු කටයුත්තක් සාර්ථකව සිදු කළ හැකි නොවේ. යමෙකුට රෝගාබාධ පවතිනම් සත්‍යාවබෝධ කළ නොහැකිය. පූතිගත්තතිස්ස තෙරුන්ගේ කථාව ඊට කදිම නිදසුනකි. දරුණු රෝගයකින් පෙළුනු පූතිගත්තතිස්ස තෙරුන්ට බුදුරජාණන් වහන්සේ උපස්ථාන කිරීමෙන් පසු කායික පහසුව ලැබීමෙන් අනතුරුව රහත් භාවයට පත් වූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. එමනිසා කිසියම් ආබාධාදියෙන් නිතර පීඩා විඳින්නෙක් නම් එවාට ප්‍රතිකාර කළ යුතු වේ. එය සුවකර ගැනීමට කාලය යෙදවිය යුතුය. ඔහුට රෝගය සංසිඳවන අයුරු සිතමින් කල් ගත කිරීමට සිදුවේ. තව ද ඔහුට යෝග්‍ය ආහාර පාන සොයා ගත යුතුය. මේ නිසා වැඩි කාලයක් ගත වන්නේ එම කාර්යයන් සඳහා ය. භාවනා කිරීමට යම් අවකාශයක් ලැබුන ද රෝගය ගැන සිතමින් කාලය ගත කිරීම නිසා සිත හසුරුවාගෙන භාවනා කිරීමට අපහසුය. රෝගාබාධයක් ඇත්නම් පළමුවෙන් ම රෝගය සුව කර ගෙන සිටිය යුතුය. එබැවින් යෝගාවචරයාට රෝගාබාධ පළිබෝධයකි.

## ග්‍රන්ථ පළිබෝධය

"ග්‍රන්ථාති පරියත්ති හරණං තං සජ්ඣායාදිහි නිච්චං බ්‍යාවටස්ස පළිබොධො හොති"[27] යනුවෙන් බුද්ධඝොෂාචාර්යයෝ විශුද්ධි මාර්ගයේ ග්‍රන්ථ පළිබෝධය පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කර

තිබේ. ''ග්‍රන්ථ'' නම් පර්යාප්ති පරිහරණයයි. එය ධාරණ, පරිචය, පරිපුච්ඡා වශයෙන් බෙදේ. ග්‍රන්ථ යනු ධර්ම ශාස්ත්‍ර අධ්‍යයනය කිරීමයි. එනම් ඉගෙනීමයි. යම් යම් දේ සජ්ඣායනා කරමින් හෙවත් හඩනගා කියමින්, ඉගෙනගන්නා දේ විචාරයට ලක් කරමින්, එවාට පිළිතුරු සොයමින්, ප්‍රශ්න මතුකරමින්, තර්ක හා විතර්ක කරමින් පොත් පත් හැදෑරීමට සිදුවේ. මේ කාර්යයන් සඳහා බොහෝ කාලයක් යෙදවීමට සිදු වේ. එසේ අධ්‍යාපනයේ නියුත්ක පුද්ගලයාට භාවනාව කෙරෙහි යොමු වීමට අවස්ථාව උදා නොවේ. ඊට හේතුව වන්නේ ඉගෙනීම කෙරෙහි මනස යොමු කිරීම ය. ධර්ම ග්‍රන්ථ භාවනාවට පළිබෝධයක් විය හැක්කේ ඒවා හැදෑරීමේ අරමුණින්ම ඒ පිළිබඳ අධ්‍යයනයෙහි යෙදුනහොත් පමණි. භාවනාවට අදාළ පොත් කියවීම බාධාවක් නොවේ. ලෞකික විවිධ බාහිර පොත් පත් අධ්‍යයනය කිරීම භාවනාවට බාධාවක් වේ. එබැවින් ග්‍රන්ථ අධ්‍යයනයේ යෙදීම ද භාවනා පළිබෝධයකි.

## ඉද්ධි පළිබෝධ

''ඉද්ධි'' නම් විදර්ශනා වැඩීමට බාධක වූ ලෞකික ඍද්ධිය යි.[28] යමෙක් සමථය වඩා උපදවා ගන්නා ලෞකික ඍද්ධීන් උපදවා ගැනීමෙන් සෑහිමකට පත් වේ නම් එය භාවනා පළිබෝධයක් වේ. බුද්ධකාලීන භාරතයේ ජීවත් වූ ආළාරකාලාම උද්දකරාමපුත්ත ආදි ඍෂිවරුන් මෙම ලෞකික ඍද්ධි පළිබෝධයෙන් යුක්ත වූවෝ ලෙස සිතිය හැකි. එසේම දෙව්දත් තෙරුන් ද මෙම ලෞකික ධ්‍යාන ලබා සිටි බවට සාක්ෂි හමුවේ. එහෙත් ලෞකික ඍද්ධිය තාවකාලික ය. කුමක් හෙයින් ද? රූපාවචර ධ්‍යාන වඩා උපදවා ගත් අයකුට එම ධ්‍යානය රැක ගැනීමට මහත් ආයාසයක් ගත යුතුය. එය වනාහි උඩු බැලි අතට හෝනා ළදරුවෙකු මෙන් ද, පැල ගොයමක් මෙන් ද බොහෝ උපද්‍රවයන් ඇති බැවින් මහත් ආයාසයෙන් රැකගත යුතු වේ. එය පිරිහී යාමට නොදී නැවත නැවත සමාධියට සමවැදීම් ආදිය කළ යුතු ම ය. ටික දිනක්



සමාධිය වැඩීමට අතපසු වුවහොත් සමාධිය පිරිහේ. කිසියම් ප්‍රමාද දෝෂයකින් රාග ද්වේෂ මොහාදි අකුසල් දහමක් සිතේ මතු වුවද එය නැති වී යා හැකියි. යම් අයෙක් රූපාවචර ධ්‍යානවල ම ඇලී සිටිමින් එය ම පමණක් ප්‍රමාණවත්ය යනුවෙන් සෑහීමකට පත්වුවහොත් විදර්ශනා භාවනා වැඩීමට නොහැකිවේ. එවැන්නෙකුට පෘථග්ජන ඍද්ධිය ද පළිබෝධයකි. එබැවින් විදර්ශනා වඩන්නා ඍද්ධි පළිබෝධය සිඳලිය යුතුය.

ඉහත සඳහන් ආකාරයට පළිබෝධ ධර්මයන් පිළිබඳ විවරණයක් විසුද්ධිමාර්ගයේ බුද්ධඝෝෂ හිමියන් විසින් දක්වා තිබුණ ද බුදුරජාණන් වහන්සේ විසින් මූළික පළිබෝධයන් පිළිබඳ අදහසක් නිද්දේසපාළියේ දක්නට ඇත. එම පළිබෝධයන් හා තදනුබද්ධ සෙසු පළිබෝධයන් ක්‍රමිකව පෙළ ගැස්වීමක් විසුද්ධිමාර්ගයේ දී බුද්ධඝෝෂ හිමියන් විසින් සිදු කර ඇති බව පෙනේ. මෙම පළිබෝධ ධර්ම දෙස අවධානය යොමු කරන කල පෙනී යන කරුණක් නම් පළිබෝධයේ ප්‍රබලත්වය අනුව එවා පෙළගස්වා තිබෙන බවයි. පළමු පළිබෝධය වන ආවාස පළිබෝධය ඇති පුද්ගලයාට හෝ භික්ෂුවට සෙසු කුල, ඤාති, ලාභ ආදි පළිබෝධ පහසුවෙන් උපදි. එසේම පළිබෝධ අතර නමවන ග්‍රන්ථ පළිබෝධය හා දසවන ඍද්ධි පළිබෝධය සෙසු පළිබෝධ හා සැසැඳීමේ දී සමාජයට අහිතකර ස්වභාවය ඉතා අල්පය. ග්‍රන්ථ පළිබෝධය ඇති තැනැත්තා ඉගැනීම කෙරෙහි අවධානය යොමු කරනු විනා ආවාස, ඤාති, ගන ආදිය කෙරෙහි බැදෙන්නේ අල්ප වශයෙනි. ඍද්ධියේ ඇළුණු පුද්ගලයා එහි ඇලී වාසය කිරීම කරන අතරම සෙසු පළිබෝධ කෙරෙහි නො ඇලෙයි.

ආන්තික සටහන්

1. සිරි සුමංගල හිමි, මඩිතියවෙල, සිංහල විශ්වකෝෂය II, 1960ල 581 පිට

2. Obstructions, hindrance, Obstacle, draw back, Davis, T.W.Rhys And T.M.Williim, Pali Text Society's - Pali English Dictionary, 1993, 64 P

3. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සිංහල ශබ්දකෝෂය,1960, 333 පිටුව

4. කැතුලාවල, සුමනලාල්, යෝග දර්ශනය, ගුණසේන සමාගම, 1961, 14 පිටුව

5. ධම්මවංශ හිමි, මාතර, සිංහල විශුද්ධිමාර්ග, පිටුව 140, බු.ව.2503

6. එම - පිටුව 142 -143,

7. විසුද්ධිමග්ගය, බුද්ධදත්ත හිමි, අම්බලන්ගොඩ පොල්වත්තේ (සංස්), සද්ධර්ම ප්‍රකාශ, 1914, පිටුව 66,

8. තත්ථ ආවාසොති එකෝ ඔවරකෝ වුච්චති, එකම්පි පරිවෙණං සකලොපි සංඝාරාමො'' බුද්ධදත්ත හිමි, අම්බලන්ගොඩ පොල්වත්තේ (සංස්) විසුද්ධිමග්ගය, 1914 පිටුව 66,

9. පාසාදික සූත්‍රය, දී.නි. බු.ජ.ත්‍රි.1976, 217 පිටුව,

10. යං වො මයා අනුඤ්ඤාතං අලං වො තං යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්සපටිඝාතාය. ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාව දෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං'' පාසාදික සූත්‍රය, දී.නි. බු.ජ.ත්‍රි.1976, 217 පිටුව,

11. ධම්මවංශ හිමි, මාතර, සිහල විශුද්ධිමාර්ග, පිටුව 144 - 145, බු.ව.2503

12. කුලංති ඤාති කුලං උපට්ඨාකකුලං''
බුද්ධදත්ත හිමි, අම්බලන්ගොඩ පොල්වත්තේ (සංස්) විසුද්ධිමග්ගය, සද්ධර්ම ප්‍රකාශ, පිටුව 67, 1914

13. "අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං'' අරියපරියෙසන සුත්ත, ම.නි. බු.ජ.ත්‍රි. 1960, 401 පිටුව

14. ධම්මවංශ හිමි, මාතර, සිංහල විශුද්ධිමාර්ග, පිටුව 146-147ග, බු.ව.2503

15. "ලාභොති චත්තාරො පච්චයා'' බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්) විසුද්ධිමග්ගය, සද්ධර්ම ප්‍රකාශ, පිටුව 68, 1914

16. සබ්බාසව සූත්‍රය, ම.නි.1, බු.ජ.ත්‍රි. 1960, 26 පිටුව



17. සාමඤ්ඤඵල සූත්‍රය, දී.නි.1, බු.ජ.ත්‍රි. 1976, 124 පිටුව

18. ගණෝති සුත්තන්තික ගණොවා, අභිධම්මික ගණෝවා''
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්) විසුද්ධිමග්ගය, සද්ධර්ම ප්‍රකාශ, පිටුව 69, 1914

19. නොචෙ ලභෙථ නිපකං සහායං - සද්ධිං චරං සාධු විහාරි ධීරං රාජා ව රට්ඨං විජිතං පහාය එකො චරෙ මාතඞ්ගේවෙව නාගො''
ධම්මපදය, නාගවග්ගය, 10 ගාථාව

20. කම්මන්ති නවකම්මං තං කරොන්තෙනෙව වඩ්ඪකී ආදීහි ලද්ධාලද්ධං ජානිතබ්බං''
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්) විසුද්ධිමග්ගය, සද්ධර්ම ප්‍රකාශ, පිටුව 69, 1914

21. පාරාජිකපාළි, බු.ජ.ත්‍රි. 1957, 382 පිටුව

22. අද්ධානංති මග්ගගමනං''
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්) විසුද්ධිමග්ගය, සද්ධර්ම ප්‍රකාශ, 1914, පිටුව 69,

23. විහාරෙ ආචරියුපජ්ඣාය සද්ධිවිහාරික අන්තෙවාසික සමානුපජ්ඣා කසමානචරියකා''
-එම- පිටුව 70

24. රොග නිඩ්ඩං පභං ගුරං''ජරා වග්ගය , ධම්මපදය 3 ගාථාව,

25. ද්වේ මෙ මෙ භික්ඛවෙ රොගා. කතමේ ද්වේ? කායිකො ච රොගො චෙතසිකොච රොගො''
රොග සූත්‍රය, අං.නි. බු.ජ.ත්‍රි.1960, 276 පිටුව

26. පිත්ත සමුට්ඨානා ආබාධා, සෙම්හ සමුට්ඨානා ආබාධා, වාතසමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිනාමජා ආබාධා, විසම පරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා''
ගිරිමානන්ද සූත්‍රය, අං.නි.6, බු.ජ.ත්‍රි, 1960, 198 පිටුව,

27. විසුද්ධිමග්ගය, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්) සද්ධර්ම ප්‍රකාශ, පිටුව 71, 1914

28. "ඉද්ධිති පොථුජ්ජනිකා ඉද්ධි'' විසුද්ධිමග්ගය, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්) , සද්ධර්ම ප්‍රකාශ, පිටුව 71, 1914